**ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.8 ඡේදයේ සඳහන් උපදෙස් අනුව, අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින් තැන්පත් ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ ඇති "භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්" අගය ගණනය කළ යුතු වුව ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම් වටිනාකම වූ රු.86,322,026කින් තැම්පත් ගිණුම් වටිනාකම වූ රු.2,155,346ක් අඩු කළ පසු වෙනස රු.84,166,680ක් වියයුතු වුවද, එය රු.83,866,680ක් ලෙස දැක්වීමෙන් "භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්" වටිනාකමේ රු.300,000ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | දේපළ, පිරියත හා උපකරණවල නිවැරදි වටිනාකම රු.430,183,481/-ක් වන අතර එය ප්‍රමාද දෝෂයකින් සංචිත වටිනාකම දැක්වීමේදී ඉලක්කම් මාරු කර දක්වා ඇත. කෙසේ වුවද මෙම වෙනස භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් ලෙස දැක්වෙන අගය ගණනය කිරීමේදි වෙනස් වන බැවින් මුළු වගකීම් වටිනාකම නිවැරදි ලෙස පෙන්නුම් කරනු ලබන බව කාරුණිකව දන්වමි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුවීම. |

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් හිඟ ආදායම් ප්‍රකාශයේ (**ACA – 1(i))** තොරතුරු අනුව කපාහරින ලද හිඟ ආදායම රු.20,878,937 ක් ද පෙර වර්ෂවලට අදාළ හිඟ අයකර ගැනීම් රු.101,538,604ක් ද ලෙස දක්වා ඇතත් 2022 වර්ෂයේ හිඟ ආදායම් වාර්තාවට අනුව එය පිළිවෙලින් රු.4,070,381 ක් හා රු.118,347,160ක් බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂය තුළදී 2022.02.09 ආදායම් ශීර්ෂයට සත්‍ය වශයෙන්ම බැර කරන ලද ආදායම රු.101,538,604 ක් වන අතර එම ප්‍රමාණය **ACA-1(i)** ආකෘතියට ඇතුළත් කොට ඇත. | නිවැරදි හා නිශ්චිත දත්ත ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.514,405,063ක් වුව ද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.515,380,194ක් ලෙස වැඩියෙන් දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.975,131කින් අඩුවෙන් දක්වා තිබුණ බව නිරීක්ෂණය විය. | පුනරාවර්තන වියදමට ගැලපිය යුතු වෙනත් දෙපාර්තමේන්තු වලින් දරන ලද වියදමක් වැරදීමකින් මූලධන වියදමට ගැලපීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වියදම සමස්ථයක් ලෙස සැලකීමේදී මෙම වෙනස ගැලපී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

(ඇ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අයෝජන ක්‍රියාකාරකම් යටතේ "භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" ලෙස රු.7,078,033ක මුදල් ගලායාමක් දක්වා තිබුණ ද, ශේෂ පිරික්සුමට අනුව එය රු.8,053,162ක් වුයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ගලායාම් රු.975,129කින් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | පුනරාවර්තන වියදමට ගැලපිය යුතු වෙනත් දෙපාර්තමේන්තු වලින් දරන ලද වියදමක් වැරදීමකින් මූලධන වියදමට ගැලපීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වියදම සමස්ථයක් ලෙස සැලකීමේදී මෙම වෙනස ගැලපී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

(ඈ) තැන්පතු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු 2021 වර්ෂයට අදාළ රු.822,362ක් හා 2022 වර්ෂයට අදාළව රු.541,400ක වශයෙන් එකතුව රු.1,363,762ක තක්සේරු ගාස්තු, ආදායම් ගිණුමට ගැලපීම් නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු බැංකු ගිණුමට ඍජු ලෙස තැන්පත් කරන ලද නමුත් තැන්පත්කරු හඳුනා ගැනීමට නොහැකි වූ මෙම තැන්පත් හඳුනා නොගත් ලැබීම් ලෙස පොදු තැන්පත් ගිණුමට 2022 වර්ෂය තුලදී ඇතුලත් කර ඇති අතර එම තැන්පතු විවිධ ආදායමට බැර කිරීමකින් තොරව තැන්පත් ගිණුමේ රඳවා තබා ගනිමින් තව දුරටත් තැන්පත්කරු හඳුනාගැනීමට උත්සාහ කරනු ලබන අතර පසු අවස්ථාවකදී හඳුනාගත් විට එම තැන්පතු තක්සේරු ආදායම් ශීර්ෂයට බැර කිරීමටද තැන්පත්කරු හඳුනා ගැනිමට අපහසු තැන්පතු විවිධ ආදායමට බැර කිරීමට ද කටයුතු කරනු ලැබේ. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමේ වැඩ පිළිවෙලක් හඳුන්වා දියයුතු වීම. |

**(ඉ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම් රු.3,226,345 ක් වුව ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත **SA** 82 අනුව යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම් රු.3,045,283 ක් විය. වර්ෂය තුළ ගෙවීම් කර ඇති වායුසමීකරණ යන්ත්‍ර 02ක වටිනාකම වූ රු.181,062ක් සමාලෝචිත වර්ෂයේ මිල දී ගැනීම් ලෙස ගිණුම් ගත කිරීමෙන් තොරව ආරම්භක ශේෂයට ගලපා තිබීම වෙනසට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම මුදල 2021 වර්ෂයේ රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන ස්ථාපිත කරන ලද වායු සමීකරණ යන්ත්‍ර දෙකක් ස්ථාපිත කිරීම සඳහා දරන ලද වියදම් වන බැවින් ආරම්භක ශේෂයට ගැලපීම නිවැරදිය. 2021 වර්ෂය තුලදී සපයා සවිකරණ ලද නමුත් සවිකිරීම් වියදම සඳහා වවුචර් ඉදිරිපත් කරන ලද්දේ 2022.03.15 දිනයේදී වන බැවින් ගෙවීම 2022 වර්ෂයේදී සිදු කර ඇත. මෙම වියදම ප්‍රාග්ධනික කළයුතු අතර පෙර වර්ෂයේ මිලදීගත් වත්කමකට අදාළ ප්‍රාග්ධන වියදම් බැවින් ආරම්භක ශේෂයට ගැලපිය යුතු මෙවැනි ප්‍රාග්ධනික කිරීම් සඳහා සිගාස් වැඩසටහනේ ලබා දී ඇති පහසුකම් භාවිතා කරමින් ආරම්භක ශේෂයට ගලපා ඇත. ඒ අනුව රු. 3,226,345 ක් වන 2022 වර්ෂයේදී දරණ ලද ප්‍රාග්ධන වියදම **SA** 82 මුද්‍රිතයේ නව මිලදි ගැනිම් 3,045,283 ක් සහ ආරම්භක ශේෂයට ගැලපීම 181,062/- වශයෙන් කොටස් දෙකකින් පෙන්නුම් කරනු ලබයි. | විධිමත් පරිදි වත්කම් ගිණුම් ගත කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දේපළ පිරියත හා උපකරණ රු.430,183,481ක් ලෙස දක්වා තිබුණ ද එම ප්‍රකාශයේම ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ දේපළ පිරියත හා උපකරණ සංචිතය ලෙස රු.430,483,481ක් දක්වා ඇති බැවින් වෙනස රු.300,000ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | දේපළ, පිරියත හා උපකරණවල නිවැරදි වටිනාකම රු.430,183,481/-ක් වන අතර එය යතුරු ලියන ප්‍රමාද දෝෂයකින් සංචිත වටිනාකම දැක්වීමේදී ඉලක්කම් මාරු කර දක්වා ඇත. කෙසේ වුවද මෙම වෙනස භාණ්ඩාගාරය වෙතශුද්ධ වත්කම් ලෙස දැක්වෙන අගය ගණනයකිරීමේදි අනෙකුත් අගයන් සමග වෙනස් වන බැවින් මුළු වගකීම් වටිනාකම නිවැරදි ලෙස පෙන්නුම් කරනු ලබන බව කාරුණිකව දන්වමි. | නිවැරදි සංඛ්‍යා පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සැකසීම විධිමත්ව කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 85(1)(ඇ) පරිදි හැකිතාක් තාත්වික සහ නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ආදායම රු.මිලියන 83ක් වුව ද තත්‍ය ආදායම් රැස්කිරීම රු. මිලියන 133.1ක් වූයෙන් තත්‍ය ආදායම් හා ආදායම් ඇස්තමේන්තු අතර සියයට 60ක වැනි ප්‍රමාණාත්මක විචලනයන් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉකුත් වර්ෂයේ එය සියයට 31ක් වී තිබුණි. | සාමාන්‍ය තත්වයක් යටතේ පුරොකථනය කල හැකි තොරතුරු අනුව හැකිතාක් දුරට නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කරනු ලබන නමුත් අනපේක්ෂිත හා විශාල වටිනාකම් සහිත තක්සේරු කටයුතු හා ගාස්තු ලැබීම හේතුවෙන් මෙම ඉක්මවීම සිදු වේ. උදාහරණ ලෙස 2022 වර්ෂයේ ජූනි මාසය වන විට රු.30,923,960 කි. එසේ වුවද ජූලි මාසයේදී කොළඹ වරායේ පර්යන්තයක් බදු දීම සඳහා හදිසියේ සිදු කරන ලද තක්සේරු කාර්යයට අදාල රු.84,056,400 ක තක්සේරු ගාස්තුවක් ලැබීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා වන මෙම ඇස්තමේන්තු ඉක්මවීම සිදු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව දැක්වෙන හඳුනා නොගත් ලැබීම් අවස්ථා 34කට අදාළ එකතුව රු.379,674ක් හා පොදු තැන්පතු ගිණුම අනුව අනාවරණය වූ හඳුනා නොගත් ලැබීම් රු.1,363,762ක් ද වශයෙන් එකතුව වූ රු.1,743,436ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | දිවයින පුරා විහිදුනු තක්සේරු කාර්යාල 19 ක් මගින් දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු තරනු ලබන අතර බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ ප්‍රධාන කාර්යාලයේ පමණි. ඒ අනුව දිවයින පුරා පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් දෙපාර්තමේන්තු බැංකු ගිණුමට මුදලින් හෝ චෙක්පත් මගින් තැන්පත් කිරීමට පහසුකම් සලසා ඇති අතර තැන්පතුවට අදාළ ලේඛන ප්‍රධාන කාර්යාලයට ලැබීමෙන් පසු බැංකු ගිණුම පරීක්ෂාවකින් අනතුරුව තැන්පතු සඳහා රිසිට්පත් නිකුත් කිරීම සිදුවේ. එම ලේඛන ප්‍රධාන කාර්යාලයට තැපැල් මගින් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම හඳුනා නොගත් ලැබීම් ඇති වන අතර මෙම තත්වය වලක්වා ගැනීම සඳහා පිටපත් 4 කින් යුත් නව තැන්පතු පත්‍රිකාවක් 2023 ජනවාරි මස සිට හඳුන්වා දී ඇත. ඒ අනුව මෙම ආදායම් හඳුනාගැනීම ප්‍රමාද වීමේ ගැටළුව නිරාකරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. | නිවැරදිව ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු. 719,500,478 ක හිඟ තක්සේරු ගාස්තු ආදායමෙන් රු.583,464,653 ක් හෙවත් සියයට 81 ක් වර්ෂ 01 සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක් තුළ හිඟව පවතින බව නිරීක්ෂණය විය. | හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා නිරන්තරයෙන් සිහි කැඳවීම් කරනු ලබන අතර නීති අංශයෙන් සිදුකරන ලද සිහි කැඳවීම් සඳහාද ප්‍රමාණවත් අනුකූලතාවයන් නොදැක්වූ ශේෂයන් අයකර ගැනීම සඳහා අමාත්‍යාංශ මට්ටමෙන් දන්වා යවා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී පසුගිය වර්ෂය අවසානයට පැවති රු.705,882,194 ක හිඟ ආදායමෙන් රු.118,347,160ක් හෙවත් සියයට 16.8 ක් පමණක් | නිරන්තර සිහිකැඳවීම් හා පසුවිපරම් ක්‍රියාමාර්ග මගින් සියලු හිඟ ගාස්තු අයකරගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අයකර ගෙන තිබු බව නිරීක්ෂණය වූයෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | | |
| (ඉ) | **2022** දෙසැම්බර් **31** දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් වාර්තාව අනුව ආයතන අටකින් දිගුකාලයක් අයනොවී පවතින හිඟ ආදායම් රු.**651,335,659**ක් එනම් මුළු හිඟ ආදායමෙන් **90%**ක් බව නිරීක්ෂණය විය. | මේ අතරින් එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක පදනමෙන් අය විය යුතු මුදල සම්බන්ධ කටයුතු මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු අංශය මගින් පවත්වාගෙන යනු ලබන අතර රාජ්‍ය ආයතන වලට එරෙහිව නඩු පැවරීමක් සිදු කල නොහැකි බැවින් මෙම හිඟ මුදල් පියවීමට කටයුතු කරන ලෙස මෙම ආයතන භාර අමාත්‍යාංශ වෙත නීති අංශය මගින් දන්වා යවා ඇත. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | **2022** දෙසැම්බර් **31** දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාවේ සටහන් අංක **06**ට අනුව ගාස්තු නිදහස් ආයතනවලින් අය විය යුතු ආදායම් රු.**664,839**ක් හිඟ ආදායම් ලෙස දක්වා තිබුණි. | හිඟ ආදායම් පිළිබඳ පරීක්ෂා කිරීමට පත් කරන ලද කමිටුව විසින් ගොනු **233**ක් පමණක් පරීක්ෂා කොට සිය නිර්දේශය ඉදිරිපත් කර තිබුණි ඊට අමතරව තක්සේරු දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල ගාස්තු කැඳවීමෙන් අනතුරුව වාණිජ නොවන ආයතන ලෙස හඳුනාගෙන හිඟ ආදායම් ගිණුමෙන් ඉවත් කරන ලෙස දන්වා එවන ලද ශේෂයන්ද ඇතුලත් කොට රු.**3,059,905.20** ක් වටිනා ශේෂයන් **20** ක් හිඟ ආදායම් ගිණුමෙන් ඉවත් කිරීමට අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු උපදෙස් අනුව කටයුතු කරන ලදී. | විධිමත් පරීක්ෂාවකින් පසුව නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමත් මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතු බවත්. |
| (උ) | ගාස්තු අයකිරීම සඳහා වූ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක **2020/02** අනුව වාණිජ හා වාණිජ නොවන ආයතන වශයෙන් ලැයිස්තු දෙකක් වන අතර තක්සේරු ගාස්තු කැඳවීමට | වාණිජ හා වාණිජ නොවන ආයතන ලැයිස්තු භාණ්ඩාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වරින් වර යාවත්කාලීන කරනු ලබන අතර තක්සේරු ගාස්තු කැඳවීමට හැකියාව ඇත්තේ | ආයතන ලැයිස්තු කාලීනව යාවත් කාලීන කර ගාස්තු අයකිරීම විධිමත් කිරීමේ වැඩ පිළිවෙලක් යෙදිය යුතු බව. |

| | |
|---|---|
| හැකියාව ඇත්තේ වාණිජ ආයතන වලින් පමණි. සමාලෝචිත වර්ෂයට අදාලව ආයතන **06**ක් එම ලැයිස්තු දෙකේම සඳහන් නොවූ ආයතන බව නිරීක්ෂණය වූ අතර වාණිජ හා වාණිජ නොවන ආයතන හඳුනා ගෙන ලැබියුතු තක්සේරු ආදායම් නිවැරදිව ගිණුම්ගත වන පරිදි අභ්‍යන්තර පාලනය පද්ධතියක් පවතින බව නිරීක්ෂණය නොවීය. | වාණිජ ආයතන වලින් පමණි.මෙම ලැයිස්තුවට වරින් වර ආයතන එකතු වීම හා ඉවත් වීමසිදුවන අතර මේ පිළිබඳ නොදැනුවත්කම හා අනවධානය හේතුවෙන් පළාත් කාර්යාල මගින් ගාස්තු කැඳවන ලද අවස්ථා පසුව හඳුනාගන්නා ලද අවස්ථාවන්හිදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලබයි.විගණන නිරීක්ෂණය අනුව වාණිජ හා වාණිජ නොවන ආයතන ලැයිස්තු හා ඒවාට වරින් වර සිදුවන සංශෝධනයන් පිළිබඳ අවදානය යොමු කොට තවදුරටත් පවතින ගැටළු ප්‍රධාන කාර්යාලයේ උපදෙස් ලබා ගෙන නිරවුල් කර ගන්නා ලෙස පළාත් කාර්යාල දැනුවත් කිරීමට සටහන් කර ගතිමි. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| 2015 දෙසැම්බර් 23 දිනැති අංක 2015/019 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | මූල්‍ය තක්සේරු කාර්යයන් සඳහා අත්තිකාරම් ලබාගැනීමේ දී උපකල්පිත වෙළඳ වටිනාකමෙන් සියයට 0.5ක් හෝ රු.10,000ක් යන අගයන් දෙකෙන් අඩු | තක්සේරු ගාස්තු අයකිරීමේ ක්‍රියාවලියේ පවතින බවට හඳුනාගත් අඩුපාඩු නිරාකරණය කිරීම සඳහා මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු වල | තක්සේරු ගාස්තු අයකිරීමේ ක්‍රියාවලිය විධිමත් කළ යුතු බව. |

| | |
|---|---|
| අගය අත්තිකාරම ලෙස ලබාගත යුතු වන අතර කුලී තක්සේරු සඳහා අත්තිකාරම් අයකර ගැනීමේ දී උපකල්පිත කුලී වටිනාකමෙන් සියයට 0.5ක් හෝ රු.5,000ක් යන දෙකෙන් අඩු අගය අයකර ගත යුතු වේ. මෙම අත්තිකාරම් ලබා ගැනීමේ දී උපකල්පිත තක්සේරු වටිනාකම පිළිබඳව සේවා දායකයා දැනුවත් නොකිරීම හේතුවෙන් සත්‍ය තක්සේරු බිල ඉදිරිපත් කිරීමේ දී අත්තිකාරම හා සත්‍ය තක්සේරු ගාස්තුව අතර විශාල විචලතාවක් පැවතීම නිසා අදාළ සේවාදායකයන් විසින් ගෙවීම් පැහැරහරින අවස්ථා පවතින බව නිරීක්ෂණය විය. | නිලධාරීන් හා තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පත් කරන ලද කමිටුවක නිර්දේශ මත නව ක්‍රමවේදයක් අනුගමනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලැබී ඇත. ඉදිරියේදී අදාල චක්‍රලේඛය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කිරීමෙන් අනතුරුව නව ක්‍රමවේදය ආදායම්ගත කිරීමට නියමිතය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ කාර්යසාධන වාර්තාව අනුව 2022 වර්ෂය තුළ දී තක්සේරු දෙපාර්තමේන්තුවට නිම කිරීමට නොහැකිව ඉතිරි වූ පොදු තක්සේරු කිරීම් හා වරිපනම් තක්සේරු කිරීම් ගොනු පිළිවෙලින් 11,867ක් හා 8,793ක් පවතින බව නිරීක්ෂණය විය. | තක්සේරු කටයුතු සඳහා ක්ෂේත්‍රයේදී කටයුතු කරන ලබන සහකාර තක්සේරුකරු, තක්සේරුකරු, හා ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු යන තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව 451 කි. එය එම තනතුරුවල සිටිය යුතු සමස්ථ කාර්යය මණ්ඩලය වන 760 සමඟ සැසඳීමේදී 59%කි. සත්‍ය වශයෙන් සේවයේ යෙදිය යුතු ක්ෂේත්‍ර නිලධාරින්ගේ පවතින මෙම හිඟය මෙන්ම 2022 වර්ෂය මැද භාගය තෙක් පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරි සීමාවීම මත නිම නොකල ගොණු වැඩි ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර රජය මඟින් බඳවා ගැනීම් අත්හිටුවා තිබීම මධ්‍යයේ දරණ ලද විශාල ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස 2023 අප්‍රේල් මාසයේ සිට සහකාර තක්සේරුකරුවන් 145 දෙනෙකු බඳවා ගැනීම හේතුවෙන් මෙම ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගැනීමට හැකිවනු ඇත. | තක්සේරු කටයුතු අප්‍රමාදව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීම සහ පාලන පද්ධතීන් ශක්තිමත් කළ යුතු වීම. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 වන විට නීති අංශයට ලද අභියාචනා 836කින් 276ක් පමණක් විභාග වී ඇති බවත් එය මුළු ලද අභියාචනා සංඛ්‍යාවෙන් සියයට 33 ක් පමණක් වූ අතර කාර්යන් නිම නොවූ අභියාචනා සංඛ්‍යාව 560ක් | ඒ ඒ නඩුවට අදාලව පෙනී සිටීම, කරුණු දැක්වීම, නීතිපති උපදෙස් ගැනීම, නීතිපති සහාය ලබා ගැනීම සහ ඉඩම් අත්කර ගැනීම සහ ඉඩම් අත්කර ගැනීමේ සාමාලෝචන මණ්ඩලයේ නඩු කටයුතුවලදී අත්කර ගැනීමේ නිලධාරී / ප්‍රාදේශීය ලේකම් වෙනුවෙන් | ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| හෙවත් සියයට 67ක් විය. | පෙනී සිටීම හා ඒ අදල කටයුතු යන කරුණු පමණක් නීති අංශය විසින් සිදු කෙරේ.<br>එකී නඩු කටයුතුවලට අදාලව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති අංශය විසින් ගත යුතු සෑම පියවරක්ම කාර්යක්ෂමව අනුගමනය කොට ඇති බවත් විවිධ වූ කාරණා මත අවසන් කර නොමැති නඩු කටයුතු පිළිබඳව නීති අංශයේ පාලනයෙන් තොරව සිදුවන කරුණක් බවද නීති අංශය සෘජුවම දායකත්වයක් දැරිය හැකි කරුණු සඳහා අවශ්‍ය පියවරයන් නිරන්තරයෙන් ගන්නා ලද බව ද කාරුණිකව දන්වමි. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 485ක් හෙවත් සියයට 43ක් පුරප්පාඩු පවතින බවත්, පුරප්පාඩුවලින් 331ක් හෙවත් සියයට 68ක් තෘතීය මට්ටමේ තක්සේරු කාර්යයන් ඉටු කරන නිලධාරීන් වන බවත් නිරීක්ෂණය විය. | අනුමත සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව බඳවා ගැනීම් සිදු කරන අතර,<br>• තක්සේරුකරු තනතුර සඳහා නිලධාරීන් 62 දෙනෙකු සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම් සිදු කර ඇත.<br>• තක්සේරුකරු තනතුර සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළ විභාග නිවේදනය, 2023.04.21 දිනැති ගැසට් නිවේදනයේ පල කර ඇත.<br>• ක්ෂේත්‍ර/ කාර්යාලගත නිලධාරී බණ්ඩ 2 නිලධාරී ගණයේ II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරු සඳහා විවෘත විවෘත තරඟ විභාගය | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | මඟින් 2023.04.24 දිනැතිව සහකාර තක්සේරුකරුවන් 145 දෙනෙකු සඳහා පත්වීම් ප්‍රදානය කර ඇතිබව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ද්විතීය මට්ටමේ සංවර්ධන නිලධාරීන් අනුමත සංඛ්‍යාවට වඩා 97 දෙනෙකුගේ අතිරික්තයක් පවතින බව නිරීක්ෂණය විය. | රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020 යටතේ බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් පුරප්පාඩු නොසලකා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කරන ලදි. මෙම නිලධාරීන් අතරින් 2023.04.24 දින සිට දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුවන් ලෙස බඳවාගත් නිලධාරීන් හැර අනෙකුත් නිලධාරීන් දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීමට කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන විධිමත් පරිදි කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ප්‍රාථමික මට්ටමට ඇතුළත් කාර්යාල කාර්ය සහයක තනතුරට අනුමත සේවක සංඛ්‍යාවක් නොමැති වුව ද සේවයේ නියුක්ත නිලධාරීන් 03 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. | 2020.08.09 දිනැතිව නිකුත් කරන ලද අංක 2187/27 දරණ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශ විෂය පථයන් වෙනස් කිරීම මත එවකට පැවති ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය යටතට පත් කිරීමේ දී එම අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කල කාර්යාල කාර්ය සාහයක (දෙපාර්තමේන්තුගත) සේවකයින් තුන්දෙනෙකු මෙම දෙපාර්තමේන්තුවේ පැවති කාර්යාල සේවක සේවයේ සේවා අවශ්‍යතාව මත මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරනු ලැබ ඇත. දැනට මෙම | විධිමත් අනුමැතීන් යටතේ කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

දෙපාර්තමේන්තුවට අනුමත කාර්යාල සේවක සේවයේ තනතුරු 76 ඇතුලත එම කාර්යාල කාර්ය සාහයක (දෙපාර්තමේන්තුගත) සේවකයින් 03 දෙනා ද අනුයුක්ත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.